## පළමුවන දේව ප්‍රකාශනය

එසෙකියෙල් 17:22-24

එසෙකියෙල් දිවැස්ප්‍රසාදි තුමන්ගේ පොතෙන් උපුටා ගත් කොටසකි.

**("ස්වාමින් වන මම උස් ගහ පහත් කරමි. මිටි ගස උස් කරමි.")**

මහෝත්තම දෙවි ස්වාමින් වහන්සේ මෙසේ වදාරන සේක. "උස් වූ කිහිරි ගස් මුදුනෙන් මම ම රිකිල්ලක් ගෙන එය සිටුවන්නෙමි. එහි මුදුන් රිකිලිවලින් ළපටි රිකිල්ලක් කඩා ගෙන උසට උසේ ඇති කන්දක් මුදුනේ සිටුවන්නෙමි. මම එය උස් වූ ඉශ්රායෙල් කන්ද උඩ සිටුවන්නෙමි. එයින් අතු ලියලන්නේ ය. එහි පලදාව හටගන්නේ ය. එය උතුම් කිහිරි ගසක් වන්නේ ය. පියාපත් ඇති සියලු ආකාර පක්ෂීහු ඒ යට ලගින්නෝ ය. ඒ අතුවල සෙවණෙහි උන් ලගිනු ඇත. එවිට ස්වාමින් වන මා උස් ගහ පහත් කළ බවත් මිටි ගහ උස් කළ බවත්, සරු ගහ වියළි කළ බවත්, වියළි ගහ සරු කර ඇති බවත් දේශයේ සියලු ගස් දැනගනු ඇත. ස්වාමින් වන මම මෙසේ වදාළෙමි. වදාළ ලෙසම කරමි."

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

## පිළිතුරු ගීය

ගීතාවලිය 92:1-2, 12-15

පිළිතුර: සමිඳුනි, ඔබ වහන්සේට තුති පිදීම හොබනේ ය.

ගීය: සමිඳුනි, ඔබට තුති පිදීම හොබනේ ය. මහෝත්තමයාණෙනි, ඔබේ නාමය වර්ණනා කිරීම යහපත් ය. උදෑසන ඔබේ පෙම පැවසීම හොබනේ ය. රෑ යාමයේ දී ඔබේ විශ්වාසවන්තකම පැවසීම යහපත් ය.

දැහැමියෝ තාල වෘක්ෂ මෙන් සරුසාර වන්නෝ ය. ලෙබනොන්හි කිහිරි ගස් මෙන් වැඩෙන්නෝ ය. සමිඳුන්ගේ නිවසෙහි ඔබ ඒවා රෝපණය කළ සේක. දේව මන්ඩපයෙහි ඒවා සරු ලෙස වැඩෙන්නේ ය.

වයස ගිය පසු ඒවා පලදාව දෙන්නේ ය. සාරවත් ව නිල් පැහැව ඒවා පවතින්නේය. එසේ වන්නේ සමිඳාණන් සාධාරණ බවද මාගේ ආරක්ෂකයාණන් තුළ වරදක් නොමැති බව ද දක්වනු පිණිස ය.

## දෙවන දේව ප්‍රකාශනය

2 කොරින්ති 5:6-10

පාවුලු තුමන් විසින් කොරින්තිවරුන්ට ලියන ලද දෙවන හසුනෙන් කොටසකි.

**("අපි එහි වේවා, මෙහි වේවා, සමිඳාණන් ප්‍රසන්න කිරීමට වඩාත් ආශා වෙමු.")**

එබැවින් අපි සැම විට ම ධෛර්යයෙන් සිටිමු. ශරීරය නැමති නිවාසයෙහි සිටින තුරු, අපි ස්වාමින් වහන්සේගෙන් ඈත්ව සිටින බව දනිමු. අප ජීවත් වනුයේ දැකීමෙන් නොව ඇදහීමෙන් ය. අප ධෛර්යයෙන් සිටින බව නැවත කියමු. ශරීරය නැමති නිවාසයෙන් ඈත් වී ස්වාමින් වහන්සේ තුළ විසීමට අපි වඩාත් කැමැති වෙමු. ඒ නිසා අපි, එහි වේවා, මෙහි වේවා, කොයි නිවාසයෙහි සිටියත් සමිඳාණන් ප්‍රසන්න කිරීමට වඩාත් ආශා වෙමු. මන්ද, අපි සියලු දෙනා ම තම තමාගේ ශාරීරික ජීවිතයේ දී කළ හොඳ නොහොඳ අනුව විපාක ලබන පිණිස, ක්‍රිස්තුස් වහන්සේගේ විනිශ්චයාසනය ඉදිරියෙහි පෙනී සිටීමට නියම ව සිටිමු.

දේව වාක්‍යය එසේ ය. දෙවියන් වහන්සේට ස්තෝත්‍ර වේවා.

**<u>සුපුවත් ජය නද</u>** ලූක් 8:11

ආලේලූයා! ආලේලූයා!
"බීජ නම් දෙවියන් වහන්සේගේ වචනය ය. ක්‍රිස්තුස් වහන්සේ වපුරන්නාය.
මෙම බීජ සොයාගන්නා යමෙක් වේද ඔහු සදහටම ජීවත් වන්නේ ය"යි
ස්වාමීන් වහන්සේ වදුරන සේක.
ආලේලූයා!

**<u>ශුද්ධවූ සුවිශේෂය</u>** මාක් 4:26-34

මාක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

**("එය ඉතාම කුඩා බීජය වුවද, එය සියලූ පැළෑටිවලට වඩා ලොකු වී අතු විහිදුවන්නේ ය.")**

තවද, ජේසුස් වහන්සේ කතා කරමින්, "දෙවියන් වහන්සේගේ රාජ්‍යය මෙබඳු ය. මිනිසෙක් පොළොවෙහි බීජ වපුරයි; රෑ දාවල් දෙක්හි ඔහු නිදා සිටිය දීත්, අවදිව සිටිය දීත්, ඔහු නොදන්නා අයුරින් බීජ පැළවී වැඩෙයි. පොළොව එහි ස්වභාවයෙන් ම පල හටගන්වයි. පළමුව දලූව ද දෙවනුව කරල ද ඉන්පසු කරල පුරා ධාන්‍ය ද හටගනියි. ගොයම පැසුණු කල අස්වැන්න කාලය පැමිණියෙන්, ඔහු වහා ම දෑකැත්ත යොදන්නේ ය"යි වදාළ සේක.

තවද උන් වහන්සේ මෙසේ වදාළ සේක. "මම දෙවියන් වහන්සේගේ රාජ්‍යය කුමකට සමාන කරම් ද? නැතහොත් කවර උපමාවකින් එය පහදා දෙම් ද? එය අබ ඇටයකට සමාන ය. එය පොළොවේ වපුරන කල මිහි පිට සියලූ බීජවලට වඩා කුඩා වුවත්, වපුළායින් පසුව වැඩී, සියලූ ම පැළෑටිවලට වඩා ලොකු වේ. එහි සෙවණෙහි අහසේ කුරුල්ලන්ට ලගින්න හැකි වන තරම් විශාල අතු එය විහිදුවන්නේ ය."

උන් වහන්සේ මෙවැනි උපමා රැසක් මගින්, අසන්නන්ට තේරුම්ගත හැකි පමණට දහම් දෙසූ සේක. උපමාවක් නැති ව උන් වහන්සේ ඔවුන්ට කිසිත් නොවදාළ සේක. එහෙත්, උන් වහන්සේ තමන්ගේ ශ්‍රාවකයන්ට පෞද්ගලික ලෙස සියල්ල පහදා දුන් සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය. ක්‍රිස්තුනි ඔබ වහන්සේට ප්‍රශංසා වේවා.

ලබන ඉරුදින දේව ප්‍රකාශන සඳහා http://sinhalagospel.lk/ වෙත පිවිසෙන්න.